
# චන්දු-තිමි



ජානකී සූරියආරච්චි

INNER COVER

# චන්දු-තමි



කතාව චිත්‍ර
පරිගණක අක්ෂර සහ වර්ණ සංයෝජනය

## ජානකී සූරියආරච්චි


**ටිකිරි ප්‍රකාශකයෝ**

1490/8, හෝකන්දර පාර, පන්නිපිටිය.
Tel: 2847438, E-mail: janu@tikiri.com,
Web: www.tikiri.com

ප්‍රථම මුද්‍රණය - 2009

© ජානකී සූරියආරච්චි

ISBN: 978-955-1090-73-9
**Book Ref: T/09/159**

මුද්‍රණය
තරංජී ප්‍රින්ට්ස්
නො. 506, හයිලෙවල් පාර,
නාවින්න, මහරගම. Tel: 2804773

**ස්තුතිය !**

මගේ පොත්වල අඩු පාඩු නොබැලුවද නිතරම මා ළඟ හිඳිමින් මගේ සියලු දුක සැප බලන මගේ ආදර අම්මාටත්, මා ඉල්ලූ, හැකි සියලු දේ මට ලබාදුන් මගේ ආදර තාත්තාටත්, "හරිම කරදරේ" කියමින් වුවද, මට නිරතුරුවම උදව් කරන (මගේ එකම පොතක්වත් කියවා නැති) මගේ ආදර මල්ලිටත්, මට අකුරු කියාදී මඟ පෙන්වූ මගේ ආදර ආච්චීටත්, මට සෙවනැල්ලක් මෙන් සිටින මගේ ආදර ලොකු අම්මාටත්, මගේ කතන්දර කියවා අඩු පාඩු පෙන්වාදෙන මගේ ආදර මිතුරු මිතුරියන්ටත්, භාෂාවේ මා නොදත් දේ මට හොඳින් කියාදුන් මහාචාර්ය ජේ. බී. දිසානායක මහතාට හා මහාචාර්ය කුසුමා කරුණාරත්න මහත්මියටත්, කලට වේලාවට මුද්‍රණ කටයුතු නිමකර දුන් පාලිත පෙරේරා මහතාටත්, වචනයකින් හෝ මා දිරිමත් කළ සියලුම දෙනාටත් මාගේ හෘදයංගම ස්තුතිය !

**ජානකී සූරියආරච්චි**
1490/8, හෝකන්දර පාර,
පන්නිපිටිය.
Tel: 2847438
01-11-2009



# චන්දු-තමී

...සපුමල්යාය අපේ ගම. සපුමල් ඔය ගලා බහින්නෙ අපේ ගම මැද්දෙන්. අපේ වත්ත කෙළවර වෙන්නෙ ඔයේ දකුණු ඉවුරෙන්. නිසංසලේ හෙමින් හෙමින් ගලා බහිනකොට සපුමල් ඔය අහිංසකයි කියලා මට හිතෙනවා. ඒත් ඉඳ හිට පිටාර ගලනකොට නම් මට හිතෙන්නෙ ඔය හරි නපුරුැයි කියලයි. අපේ ගෙවල් කුඹුරු ඔක්කොම යට කරගෙන, වගාවල් ඔක්කොම පාළු කරගෙන, ගම සෝදාගෙන, ඔය දුවනවා.

වත්ත පිටිපස්සෙ ඔය අද්දර තියෙන ගල් තලාවට මම ගොඩක් ආසයි. ඉස්කෝලෙ ගිහින් ආවාම තමිලිනීයි මමයි සෙල්ලම් කරන්න යන්නෙ මේ ගල් තලාවට. තමිලිනී කියන්නෙ මගේ හොඳම යාළුවා. හොඳම කිව්වට දවසට සැරයක් දෙකක්වත් තරහ නම් වෙනවා තමයි. ඒත් ඒ තරහ ටික වෙලාවයි. එයා හරි මං හරි ආයෙත් යාළු වෙනවා. ඊට පස්සෙ තරහා වුණේ ඇයි කියලාවත් මතක නෑ.

මට මතකයි එයාලා සපුමල්යායෙ පදිංචියට ආ දවස. හරියටම අපේ අල්ලපු ගෙදරට. ලොරියෙ බඩු බාන හැටි මම කම්බි වැටේ එල්ලිලා බලාගෙන හිටියා. කවුද දන්නෙ නෑ අලුතෙන් එන කට්ටිය! කවුරු වුණත් කමක් නෑ,
අපේ අයියට වඩා හොඳ කෙනෙක් නම් ඒ ඇති.
අක්ක කෙනෙක් හරි නංගි කෙනෙක් හරි නම් වැඩිය හොඳයි.
අයියලා වගේ ටොකු අනින්නෙ, රණ්ඩු වෙන්නෙ නෑ නෙ.
ඒ වුණාට අපේ පන්තියෙ එරන්ද නම් කියන්නෙ අක්කලා නම් එපාමයි කියලයි.
එයාට ඉතින් අක්කලා නංගිලා හතර දෙනෙක්මනෙ.
හරි කරදරේලු. මුරකාරයා වගේ තනියට එහෙ මෙහෙ යන්න වෙනවලු.
කියන කියන සැරේට කඩේ දුවන්න ඕනෙලු. ඒ මදිවට රණ්ඩු කෙකිලු.
අනේ මන්ද කවුරු හොඳද කියලා.
කවුරු හරි කමක් නෑ, බලමුකො !



ඔන්න එතකොටම ලොරියෙන් බැස්සා
සාරියක් ඇඳගත්තු මහත අම්මා කෙනෙක්.
නළලෙ ලොකු රතු මොට්ටුවක් තියලා,
කොණ්ඩෙ මල් ගහලා. කවුද මේ?
ඊළඟට බැස්සා පුංචි ගෑනු ළමයෙක්.
එයත් රතු මොට්ටුවක් තියලා,
කොණ්ඩෙ මල් ගහලා,
අත් දෙකේම වළලු පුරවලා.
"සිළිං - බිළිං" ආ--! කකුලෙ ගෙජ්ජිත් දාලා.
මේ කවුද මේ? හරි අමුතුයි.
මට හිනා ඇවිත් කට තද කරගෙන
පිටිපස්ස හැරුණා.





ආ! මෙන්න, අම්මාත් ජනේලයෙන් බලාගෙන ඉන්නවා.
අම්මටත් හිනාද දන්නෙ නෑ. ඒත් අම්මගේ මූණෙ නම්
හිනාවක් පෙනෙන්නවත් නෑ. මූණ ඇඹුල් වෙලා වගේ.
මම ඉක්මනට ගේ ඇතුළට දිව්වා.
අම්මාගෙන් අහන්න ඕනෙ විස්තරේ.
"අම්මා අම්මා ඒ කවුද?" මම ඇහුවා.
.....උත්තරයක් නෑ.

තාත්තා අම්මට මොනවදෝ කියනවා. "ඔයා එච්චර හිතට ගන්න එපා. ඒ අලුත් ජලාශය හදන්න ආපු ඉංජිනේරුවෙක්. යාපනෙන් මෙහාට මාරු කරලා. ඒගොල්ලො අහිංසක දෙමළ මිනිස්සු." තාත්තා එහෙම කීවෙ අම්මට.
"දෙ-ම-ළ!!" මට ඉබේටම කියවුණා.

මම ඊට කලින් කවදාවත් දෙමළ ජාතියෙ කෙනෙක් දැකලා තිබුණෙ නෑ. අපේ ගමේ දෙමළ කවුරුවත් හිටියෙත් නෑ. මම හිතාගෙන හිටියෙ නම්, දෙමළ අය හැමෝගෙම අතේ තුවක්කුයි බඩේ බෝම්බයි තියෙනවා කියලයි. ඇත්තමයි, මට හිතුණෙ එහෙමයි. ඇයි හැම තිස්සෙම මට ඇහිල තියෙන්නෙ ඒ වගේ දේවල්නෙ. ලොරියෙත් බෝම්බද දන්නෙ නෑ. ගිහින් බලන්න ඕනෙ. මම ආයෙත් වැට ළඟට දුවන්න හැදුවා, තව විස්තර ටිකක් බලාගන්න.

"කොහෙද දුවන්නෙ? යන්නෙ එහෙම නෑ ඒ පැත්තට. තේරුණාද?"
අම්මා මගේ වැලමිටෙන් අල්ලාගත්තා, භයියෙන්. අම්මගේ මූණ අමුතුයි.
ඒ දුකක්ද, කේන්තියක්ද, නැත්නම් ඒ දෙකමද මන්දා. ඇස්වලත් කඳුළු.
"ඔය ඉතින් ! ඔය දරුවට යන්න අරින්න. ඔයාට නම් කිව්වට වැඩක් නෑ. එක දෙයක් නිසා හැමෝම ගැන ඔහොම වැරදියට හිතන්න එපා."
තාත්තා ආයෙත් කිවා.

මට නම් කිසිම දෙයක් තේරුණේ නෑ. මට ඕනෙ වුණේ එහා ගෙදරට ආ පුංචි යාළුවා කවුද කියලා බලාගන්න විතරයි. පාළුවේ ඉඳලා ඉඳලා මට ඇති වෙලා. අයියා ඉස්කෝලෙ නිවාඩුවට ගෙදර එනකල් මම හැමදාම ඉන්නෙ තට්ට තනියම. සපුමල් ඔයේ ගල් දෙබොක්කාවෙ ඉන්න මාලුන්ගෙන් ඇහුවා නම් කියයි මං කොච්චර පාළුවෙන්ද ඉන්නෙ කියලා.

පහුවදා උදේ නැගිට්ට හැටියෙම මම ජනේලය ළඟට ගිහින් බැලුවා. ජනේලය ළඟ තියෙන සැපතිල්ලා ගහේ කොළ අස්සෙන් මට එහා ගෙදර ඉස්තෝප්පුව පෙනෙනවා. ලොරිය නම් ගිහිල්ලා. සමහර බඩු තවම මිදුලෙ. තව චුට්ටක් ඔළුව හරවලා බැලුවාම කෑම කාමරය පෙනෙනවා. කුස්සියෙන් දුමකුත් නගිනවා. ඒ එක්කම අමුතු සුවඳක් එනවා. ම්---- හොඳ රස කෑමක් හදනවා වගේ. මම තවත් හොඳට වට පිට බැලුවා.
කෝ එයා පෙනෙන්නවත් නෑ. තවම නිදිද දන්නෙ නෑ.
අපෝ හරි කම්මැළියෙක්ද කොහෙද!
මම ආපහු හැරෙන්න හැදුවා.




අහ් ! එතකොටයි දැක්කෙ
වැට අයිනෙ කවුදෝ මල් කඩනවා!
ඒ එයා තමයි! කොණ්ඩෙ මල් ගහලා,
නළලෙ මොට්ටු තියලා. ඒ විතරක් නෙමෙයි.
හොඳට බැලුවාමයි දැක්කෙ,
නහයෙ කරාබුවකුත් දාලා. හරි අමුතුයි.
මට එකපාරටම හිනා ගියා.
හොඳ වෙලාවට එයා මාව දැක්කෙ නෑ.
මම ඉක්මනට එතනින් දිව්වා කුස්සියට.
ලොකු සතුටකින් මගේ හිත පිරිලා වගේ.
අමුතු යාළුවෙක් තමයි මට
හම්බවෙන්න යන්නෙ.
අපේ පන්තියෙ කාටවත් නැතුව ඇති
මේ වගේ යාළුවෙක්.
"කෝ ඉතින්, තවම යාළු නැනෙ."
මගේ හිත මට ඇද කළා.
ආඩම්බරද දන්නෙත් නෑ.
----බලමුකො.

මම ඉක්මනට දත් මැදලා මූණ සෝදලා කෑම කෑවා. වෙනදා වගේ නෙමෙයි අද නම් ඉර හොඳට පායලා වගේ. වත්තම එළියයි. සියඹලා ගහේ වුණත් වෙනදාට වඩා කරල් හැදිලා වගේ. ගැටපිච්ච වැලේත් අපේ පැත්තෙ මල් ගොඩක් පිපිලා. මීට කලින් මම ඒක දැක්කෙ නැත්තෙ ඇයි දන්නෙ නෑ. වෙනදා මල් පිපුණාද කියලාවත් මට හරියට මතක නෑ.

මම මූණ සෝදගෙන හෙමින් හෙමින් මිදුලට බැස්සා. වැට අයිනෙ ලොකු ගහේ නමිනං හැදිලාද දන්නෙ නෑ. ගිහින් බලන්න ඕනෙ. මට අද වැඩ ගොඩයි, වැට අයිනෙ. අත්තම්මා දැක්කා නම් අහයි, “මොකෝ පුතේ අද වැට අයිනෙ සෙල්ලම් කරන්නෙ, ඇයි ගල්පොත්තට යන්නෙ නැතෙයි?” කියලා.

ඔන්න එතකොටම “එයා” එළියට ආවා. නිකම් නෙමෙයි, මොකද්දෝ පිළිමෙකුත් අරගෙන. ටිකක් වඳුරු හැඩයක් තමයි පෙනුණේ. ඒ පිළිමය අඹ ගහ යට කණුවක් උඩ තියලා මල් මාලයක් දැම්මා. මේ මොකද මේ? වඳුරු පිළිමයකට මල් මාලා දමනවා ? අමුතු වැඩ තමයි එයාලා කරන්නෙ. ඊළඟට ගිහින් තව පිළිමයක් අරගෙන ආවා. ඒක නම් මම කොහේ හරි දැකලා තියෙන දෙවි කෙනෙක් වගේ. ඒකත් එතනම තියලා මල් මාලයක් දැම්මා. ඊට පස්සෙ ලොකු අක්කා කෙනෙක් තවත් පිළිම දෙක තුනක්ම අරගෙන ආවා.
එයාගෙ අක්කා වෙන්න ඇති. ඊළඟට දෙන්නා එක්ක
දණ ගහගෙන ඇස් පියාගෙන වැන්දා.
මම නමිනං ගහේ අත්තකට වෙලා බලාගෙන හිටියා.
එයාලා අපි වගේ පන්සල් යන්නෙ නැතුව ඇති.
ඊට පස්සෙ අක්කා ගෙට ගියා.
මම ගහෙන් බහින්න අන්තිම
අත්තට කකුල තිබ්බා.
ඒත් අහක බලාගෙන බැස්ස නිසාදෝ,
නමිනං ගෙඩි හුරගෙන මාව
“දොහ්” ගාලා තණකොළ ගොඩට වැටුණා.
මට “වහ්” කියවුණා. රිදුණාට නෙමෙයි,
එයා මාව දැක්කා නම් කියලා.



හොඳ වෙලාවට දැක්කෙ නෑ. ඒත් මොකද්ද සද්දෙ කියලා එයා වට පිට බැලුවා. ඒත් ඒ වෙනකොට මම මොකුත් වුණේ නෑ වගේ නැගිටලත් ඉවරයි. මාව දැකලා එයා පුදුමයෙන් ගැස්සිලා වගේ බැලුවා. හිනා වෙම්දෝ නොවෙම්දෝ කියලා මට හිතා ගන්න බැරි වුණා. ඒත් ඊට කලින් එයා හිනා වුණා.

අනේ හරි හොඳ පාටයි. ඉතින් මමත් හිනා වුණා.



"උංගලුඩය පෙයර් එන්න?" එයා හිනා වෙලා ඇහුවා.

අපොයි, ඒ මොකද්ද කිව්වෙ? එන්න !

මට "එන්න" කියලද දන්නෙ නෑ කිව්වෙ?

"එන්න බෑ, අම්ම බනී."

මම නමිනං ගෙඩියක් පොඩි කරමින් කීවා.



එයා නළල රැළි කරලා බැලුවා. මිහ් ! මගේ උත්තරේ වැරදිද දන්නෙ නෑ. නැත්නම් එයා කී දේ මට තේරුණේ නැද්ද දන්නෙත් නෑ. මෙහෙම කොහොමද අපි යාළුවෝ වෙන්නෙ. කතා කරන්න බැරුව? කොහොම හරි එයා කී දේ මට තේරුණේ නෑ කියලා එයාට තේරුණා වගේ.

"එන්නුඩය පෙයර් තමිලිනි. තමී, තමී," එයා එයාට අතක් තියලා පැහැදිළිව කීවා. ආ, "පෙයර්" කියන්නෙ "නම" වෙන්න ඇති.

"අ--ආ- මගේ පෙයර් චන්දුල්. චන්දු, චන්දු. මමත් එයා කී විධියටම කීවා. තමී ඔළුව වනලා හිනා වුණා. මමත් හිනා වුණා. ඊළඟට මොනවද අහන්නෙ? මට අහන්න දෙයක් කල්පනා වුණේත් නෑ. වයස කීයෙද, මොන පන්තියෙද කියලත් අහන්න ඕනෙ. ඒත් කොහොමද? අහන හැටි දන්නෙ නෑනෙ. ඒත් එතකොටම "තමී---තමී--- නිංගල් එංගේ ඉරුක්කිරීර්කල්. ආ--?" ගේ ඇතුළෙන් කෑ ගැහුවා. "නාන් පෝයි වරුකිරේන්." කියලා තමී ගේ දිහාට දිව්වා. ඒ කිව්වෙ ගිහින් එන්නම් කියලද, අම්ම අඬගහනව කියලද දන්නෙ නෑ.

ඊට පස්සෙ පහුවදා උදේත් මම නැගිට්ට හැටියේම ජනේලය ළඟට ගියා. එයා උදේට මල් කඩන්න වැට ළඟට එනවනෙ.... කිව්වත් වගේ එයා මල් කඩනවා. ඊයෙ ආව සුවඳ අදත් කුස්සිය පැත්තෙන් එනවා. ඉවසන්න බෑ. මගේ කටට කෙළ ඉනුවා. මොනවා හරි බදිනවා වගේ. මම ජනෙල් කණ්ඩියේ ගැලවුණු පුංචි හුණු පතුරක් අරගෙන මල් වැට උඩට විසි කළා. තමී ඔළුව උස්සලා බැලුවා.

"ආ---චන්දු ! ---- එප්පඩි ඉරුක්කිරීර්කල්?"

අයියෝ, ආයෙමත් දන්නෙ නැති එකක් ඇහුවානෙ. මම කට ඇද කරගෙන බලා හිටියා. මට තේරෙන්නෙ නෑ කියලා එයා දන්නවා ඇති.

එයා මොනවදෝ මතක් වුණා වගේ හිනා වෙවී ඉක්මනට කුස්සිය පැත්තට දිව්වා. ඊට පස්සෙ මොනවදෝ අතේ ගුලි කරගෙන ඇවිත් මට දික් කළා. "උංගලුක්කු උළුන්දු වඩයි වේන්ඩුමා?" ආ ඒ කියන්නෙ මට ඒවා ඕනෙද කියලා වෙන්න ඇති. අහපු විධියෙන් මම හිතා ගත්තා. මම ජනේලෙන් පැනලා වැට ළඟට ගියා.

තමී මහත වළල්ලක් වගේ සුවඳ හමන කෑමක් මගේ අතේ තිබ්බා.

මම උදේ දත් මැදලත් නැතුව කෑල්ලක් කටේ දමා ගත්තා. ස්--- හරි රහයි.

"උළුන්දු වඩයි." එයා ආයෙත් කිව්වා.

ආ--- මේ උළුඳු වඩේද? අහල තිබුණාට කාල තිබුණෙ නැනෙ.

ඒත් එතකොටම, "චූටි පුතා, එන්න මූණ සෝදන්න. ඉස්කෝලෙ යන්න පරක්කු වෙනවා----" ඒ අම්මගෙ සද්දෙ. දැන් මොකද කරන්නෙ? කටේ වඩේ! විසි කරන්නත් බෑ, රසයි. මම ඉතුරු වඩේ කෑල්ලත් කටේ ඔබාගෙන ළිඳ පැත්තෙන් දිව්වා. අපොයි ! ඉස්සරහටම හම්බ වුණේ අම්මා.

"මොනවද කටේ! කෝ බලන්න?"
අම්මා මාව අල්ලාගෙන
කටේ අත දාලා වඩේ කෑලි ටික
එළියට ඇද්දා.
චහ්! අපරාදෙ!
"ඒ ඕංගට කන්න ගියා උළුඳු වඩේ.
තව මොනවා කවයිද මං දන්නෙ නෑ.
ආයිත් ඒ පැත්තට ගියොත් එහෙම මම---"
අම්මා කේන්තියෙන් මගේ
කණින් අල්ලලා හෙල්ලුවා.
ඇයි දන්නෙ නෑ අම්ම තමිලිනිලා
එක්ක ඔය තරම්ම තරහ.



පහුවදා උදේ අම්මා ඉඹුල් කිරිබත්
හදලා තිබුණා. මං හරිම ආසයි ඉඹුල් කිරිබත්වලට.
ඒත් කන්න වාඩි වුණාට මට කන්න බෑ-බෑ වගේ.
මේ තරම් රස කෑමක් කොහොමද තනියම කන්නෙ? මම හෙමින්ම ඉඹුල් කිරිබත් ගෙඩියක් අරගෙන ගියා වැට ළඟට. තමී වෙනදා වගේම මල් කඩනවා.
"තමී---ආ--- ඉඹුල් කිරිබත්!" මම වට පිට බලලා වැටෙන් එහාට අත දික් කළා.
"ආ---- චන්දු ! ඉම්බුල් කීබා---?" තමී හිනා වෙවී ඇවිත් ඉඹුල් කිරිබත් ගෙඩිය ගත්තා. "රොම්බ නන්රි !"
මම රෑං ගාලා ආපහු ගෙට දිව්වා. අපේ අම්මා වගේ තමිලාගෙ අම්මත් තමීට බනිද දන්නෙ නෑ, අපේ කෑම කෑව කියලා.

මම ඉස්කෝලෙ ගිහින් එන අතරෙ කල්පනා කළේ “හවසට මාලු අල්ලන්න එනවද” කියල අහන්නෙ කොහොමද කියලා. “ෆිෂ් කැච් කම්” කිව්වොත්? බෑ, ඒ ඉංග්‍රීසිනෙ. දෙමළෙන් කොහොමද දන්නෙ නෑ මාලු අල්ලනවට කියන්නෙ. එහෙම නැත්නම් හැංගි මුත්තන් කරමුද කියලා අහන්නෙ කොහොමද?
චහ් ! දෙමළ දන්න කෙනෙක් හිටිය නම් අහගන්න තිබුණා.

මම දවල්ට කාලා ආයෙත් වත්ත පහළට ගියා. ආ, අර ඉන්නෙ තමී. තනියෙන් බට්ට පනිනවා. තණකොළ බිස්සෙ පුළුවන්යැ බට්ට පනින්න? මටත් ගොඩ කාලෙකින් බැරි වුණා බට්ට පනින්න. තනියෙන් පනින්න කම්මැළියිනෙ. තමීටත් මට වගේම සෙල්ලමට කෙනෙක් නැතුව කම්මැළි ඇති.
මම වත්ත පහළට ගිහින් තමීට අත වැනුවා. තමීත් හෙමින් හෙමින් වත්ත පහළට ආවා. වත්ත ඉවර වුණාම තියෙන්නෙ සපුමල් ඔයේ ගල්තලාව.
සපුමල් ඔය මට ගෙදර වගේම පුරුදුයි.
ඒ නිසා අම්මා එතරම් බයක් නැතුව මට යන්න දෙනවා.
අපි දෙන්නාට කතා කරගන්න බැරි වුණාට
බට්ට පනින්න නම් පාඩුවක් වුණේ නෑ.
අපි දෙන්නා ගල් තලාවෙ කොටු ඇඳලා
බට්ට පනින්න පටන් ගත්තා.
“සිළිං බීළිං” තමී බට්ට පනිනකොට
මට හරි හිනා. ගෙජ්ජිවල සද්දෙ හරියට
පන්සලේ ඇතා බට්ට පනිනවා වගේ.
අපි දෙන්නම කියාපු දේවල්
අපි දෙන්නටම තේරුණේ නෑ.
ඒ වුණාට එයත් මම වගේම
තුනේ පන්තියේ බව නම් අතින් පයින්
කොහොම හරි දැන ගත්තා.
තමී හරි හොඳයි කියලා මට එදාම හිතුණා.
අපේ අයියට වගේ කේන්ති යන්නෙ නෑ.
හොඳ යාළුවෙක් හම්බ වුණාම
කොයි තරම් සතුටුද?



කළුවර වෙනකල්ම බට්ට පැනලා අපි හිනා වෙවී ආපහු ආවා.
දර එකතු කරන්න වත්ත පහළට ඇවිත් අත්තම්මා අපි දිහා බලාගෙන හිටියා.
“චුටි පුතාට හරි යාළුවෙක් හම්බ වෙලා වගේ.” අත්තම්මා හිනා වෙවී ඇහුවා.
“හි - හි - හි ----”
මම තමිලිනීට අත වනමින් හිනා වෙවී අත්තම්මා ළඟට ගියා.
“ඔය හැටි හිනා වෙන්නෙ, පුතාට තේරෙනවැයි ඒ ගොල්ලන්ගෙ බාසාව?”
අත්තම්මා පොල් පිති එකතු කරමින් ඇහුවා.



"හිනා වෙන්න මොකටද භාෂාවක්?
හොඳයි අත්තම්මා කියන්න සිංහලෙන්
හිනා වෙන්නෙ කොහොමද කියලා
---හි හි හි ---
එතකොට කියන්න දෙමළෙන්
හිනා වෙන්නෙ කොහොමද කියලා
---හි හි හි---
ඉතින් දෙකම එකමනෙ." මම කිව්වා.
අත්තම්මට හොඳටම හිනා.
"පිස්සු කොල්ලෙක් තමයි!"
අත්තම්මා මාව තුරුල් කරගනිමින් කිව්වා.
"හැබැයි ඕං අම්මට පේන්න නම් වැඩිය
සෙල්ලමට යන්න එපා, තේරුණායි?"
අත්තම්මා කීවා.

"අත්තම්මෙ, මං අහන්නමයි හිටියෙ. අම්මා ඇයි තමිලිනිලා එක්ක ඔච්චර තරහා?" මම අත්තම්මාගෙ අතින් අල්ලාගෙන ඇහුවා.
"--ත්--ම්-----!" අත්තම්මා ලොකු හුස්මක් ගත්තා. හිනා මූණ වෙනස් වුණා.
"--- පුතාට මතකයිද පුතාගෙ චූටි මාමට වෙච්ච දේ? --- අම්මා චූටි මාමාට පණ වගේ ආදරෙයි --- අම්මගෙ එකම මළයනෙ. ඒ සිද්ධියෙන් පස්සෙ තමයි ඔය-----" අත්තම්මා ඈත ගල්තලාව දිහා බලාගෙන කීවා.
අත්තම්මගෙ ඇස්වලින් සට සට ගාලා කඳුළු බේරුණා.

මට යාන්තමට වගේ මතක තිබුණා ඒ දවස.... චූටි මාමාව පෙට්ටියකින් ගෙනා හැටි... සෙනඟ පිරිලා... හැමෝම සුදු ඇඳලා. හැම තැනම සුදු කොඩි එල්ලලා. ලොකු කලබලයක්.

".....විශ්ව විද්‍යාලෙ ඇරිලා එනකොට කොළඹදි බෝම්බයකට අහුවෙලාලු. බෝම්බ කියන්නෙ රතිඤ්ඤාවලටත් වඩා මහ හයියෙන් පිපිරෙන ඒවාලු. ඒවට මිනිස්සු මැරෙනවලු."
මට කියා දුන්නෙ කරන්දෙණියෙ බාප්පලාගෙ පොඩි අයියා.
ඒත් මට ඒවා තේරුණේ නෑ. මගේ හිතේ නම් තිබුණෙ මොකක්දෝ සතුටක්.
සෙනඟ පිරිලා, නෑදෑයො ඇවිල්ලා වැඩ ගොඩයිනෙ. මම කහ පාට "ඔරෙන්ජම්බාලි" බෝතලයක් බදාගෙන එහෙට මෙහෙට ඇවිද ඇවිද හිටියා.



....අපේ අම්මා පොළොවෙ හැපි හැපී ඇඬූ හැටි මට මතක් වුණා. අහල පහළ හැමෝමත් ඇඬුවා. කූරා කුඹියෙකුටවත් වරදක් නැති අහිංසකයාලු. ලොකු අම්මත් පෙට්ටිය බදාගෙන අඬනවා මට මතකයි. ඒත් මට නම් ඇඬුණෙ නෑ. මට කිසිම දෙයක් තේරුණෙත් නෑ. චූටි මාමා පෙට්ටියේ නිදාගෙන ඉඳලා පස්සෙ නැගිටීවි කියලයි මම හිතුවෙ. ඒත් ඊට පස්සෙ මට ඒ දවස හෙමින් හෙමින් අමතක වෙලා ගියා. මට හොඳටම මතක තිබුණෙ සච්නි අක්කලා සැරින් සැරේට අල්ලපු පාට පාට බීම වීදුරු විතරයි.

අම්මට නිතරම චූටි මාමව මතක් වෙනවා ඇති. එතකොට වෙන්න ඇති දුක හිතෙන්නෙ, කේන්ති යන්නෙ. ඒත් අත්තම්මා නම් එහෙම නෑ. දුකයි තමයිලු. ඒත් බුදු බණ අහලා අත්තම්මා හිත නිවාගෙනලු ඉන්නෙ. ඒ නිසා කාටවත් වෛර කරන්නෙ නෑලු. සංසාරෙ හැටි ඔහොම තමයිලු.

කොහොම වුණත් අම්මා පව්! මට අම්මා ගැන දුක හිතුණා. මම ආයෙත් තමිලිනී එක්ක කතා කරන්නෙ නෑ. ඒ පැත්තටවත් යන්නෙ නෑ....

ඒත්---- තමිලිනීත් පව්. තමිලිනී නෙමෙයිනෙ බෝම්බ හැදුවෙ. එහෙම හිතනකොට හැමෝම පව් තමයි ! කාලෙකට පස්සෙ සෙල්ලම් කරන්න හම්බ වුණු යාළුවා එක්ක සෙල්ලම් කරන්න ඉඩක් නැති නිසා මමත් පව්. හොඳයි නැද්ද?

කොහොම වුණත් තමිලිනී එක්ක වැඩිය සෙල්ලම් කරන්න නොගිහින් ඉන්න මම හිතා ගත්තා. ඒත් කොහෙද, හවස් වෙනකොට මගෙ හිත මට, "යන්න යන්න සෙල්ලම් කරන්න !" කියනවා. එතකොට මට සෙල්ලම් නොකරම බැරි වෙනවා. ටිකෙන් ටික ගල්පොත්ත දිහාට යැවෙනවා. මම නෙමෙයි යන්නෙ, මගේ කකුල් දෙක !

ඔහොම ටික දවසක් යනකොට තමිලිනියි මමයි හොඳටම යාළු වුණා. ඉස්කෝලෙ ගිහින් ආවාම මම කෙලින්ම දුවන්නෙ ගල්පොත්තට. තමිලිනීත් එනවා ගල්පොත්තට. එයා තවම ඉස්කෝලෙ යන්නෙ නෑ. ලොකු අක්කා එයාට ගෙදරදි පාඩම් කියා දෙනවලු. සිංහල දැනගෙන හිටියා නම් එයාට අපේ සපුමල්යාය කණිටු විදුහලටම එන්න තිබුණා. මගේ පන්තියටම වැටුණා නම් කොච්චර හොඳද?

අපෙ අයියා වගේ නෙමෙයි තමිලිනී හරි හොඳයි. අයියා වගේ රණ්ඩුවට එන්නෙ නෑ. අයියා එක්ක විනාඩි පහක් සෙල්ලම් කළා නම් ටොකු හතරක්වත් කන්න වෙනවා. ඒ අපෙ අයියගෙ හැටි. ඒ වුණාට වෙලාවකට නම් හරි හොඳයි. දවසක් ඉස්කෝලෙ ළමයෙක් මට කුරුම්බැට්ටියකින් ගහපු දවසේ, අයියා තමයි ඒ ළමයටත් ගහලා මාව වඩාගෙන ගෙදර ආවෙ. එදා නම් හිතුණා අයියා මට ආදරෙයි කියලා. ඒත් පහුවදා එයාගෙ ගණන් පොත උඩ තීන්ත චූට්ටක් හැලුණා කියලා මට දුන්නා හොඳ පාරක්.

කොහොම හරි ශිෂ්‍යත්වෙන් අයියා කොළඹ ඉස්කෝලෙකට ගිය දවසෙ තමයි අයියගෙ අගේ මට දැනුණෙ. එදා නම් අයියාත් ඇඬුවා, මමත් ඇඬුවා. නිවාඩුවට අයියා එනකල් මම හිටියෙ ඇඟිලි ගැන ගැන. ඒත් ඒ ආදරේ තිබුණෙ දවසයි දෙකයි. හපෝයි---- ඊට පස්සෙ මම ඇඟිලි ගැන ගැන හිටියෙ අයියා යනකල්. කාටද පුළුවන් හැමදාම ටොකු කන්නයි ගුටි කන්නයි.
"හැබෑට මේ අයියල මල්ලිලට එක විනාඩි පහක් ඉන්න බැනෙ රණ්ඩු නොවී."
අම්මත් එන්නෙ බණින්නමයි. රණ්ඩු නැතුව සෙල්ලම් කරන්න පුළුවන් කියලා මම ඇත්තටම දැනගත්තෙ තමිලිනීගෙන්.

ටික දවසක් යනකොට තමිලිනීට සිංහල ටික ටික පුළුවන් වුණා.
"අරි ඔන්දයි." "යෙන්ඩ බෙරි වුණා." "අයියයියෝ----යේක දූනව දූනව."
තමිලිනී සිංහල කතා කරනකොට මුල් දවස්වල මට බඩ අල්ලගෙන හිනා.
ඒත් හරි පුදුමයි, එයා හරි ඉක්මනට සිංහල ඉගෙන ගත්තා.
ආ, තමිලිනීට සිංහල පුළුවන් විතරක් නෙමෙයි, මට දෙමළත් පුළුවන්.
"ආනා-ආවන්නා-ඌනා-ඌවන්නා, ඔන්රු-ඉරන්ඩු-මූන්රු-නාංගු ---"
මම ගෙදර ඇවිත් අත්තම්මට කියා දෙනවා. අත්තම්මා හිනා වෙවී අහගෙන ඉන්නවා. "නායි කියන්නෙ බල්ලා. පූනෙයි කියන්නෙ පූසා. නාක්කු කියන්නෙ දිව. මූක්කු කියන්නෙ නහය." දැන් අත්තම්මටත් ටිකක් ටිකක් දෙමළ පුළුවන්.

ටික දවසක් යනකොට අපි දෙන්නටම දෙමළ, සිංහල හොඳට පුළුවන් වුණා. ඇත්තටම අපි සෙල්ලම් කරනකොට කතා කළේ මොන භාෂාවද කියලා අපි දෙන්නටම මතක නෑ. දෙකම කළවමේ. කොහොම හරි කියාගන්න ඕනෙ දේ කියවුණා නම් එච්චරයිනෙ. භාෂාවල් තියෙන්නෙ අදහස් කියාගන්නලුනෙ.



තමිලිනී මට එයාලගෙ යාපනේ විස්තර ගොඩක් කීවා. ඉස්සර හිටියෙ යාපනේ අරුක්කුවේලි කියලා ගමකලු. මුහුද කිට්ටුවලු. එයාට හොඳට පීනන්න පුළුවනුත් ඒ නිසාලු. එයාට ලොකු අයියා කෙනෙකුත් හිටියාලු. එයා වෙඩි වැදිලා මැරිලා දැන් අවුරුදු දෙකකටත් වැඩියිලු. අම්මා තවමත් මතක් වෙනකොට අඬනවාලු. යුද්ධෙන්ලු නැති වුණේ.

"ඉතින් ඔයාලගෙ අම්මත් අපි එක්ක තරහින්ද ඉන්නෙ?" මම ඇහුවා.

"මම දන්නෙ නේ." තමිලිනී කිවෙ බිම බලාගෙන දුකෙන් වගේ.

තමිලගේ අම්මා එක දවසක් නම් මගෙ දිහා බලලා යන්තමින් හිනා වුණා. ඒත් අපේ අම්මා එක්ක නම් හිනා වෙනවා මම කවදාවත් දැකලා නෑ. ඒත් තාත්තා නම් තමිලගෙ තාත්තා එක්ක කතා කරනවා දවස් දෙක තුනක්ම දැක්කා කියලා තමි කීවා. එයාලා මෙහේ පදිංචියට එනකොට ඉස්කෝලෙ ළමයි කිව්වලු, අපොයි එහේ යන්න එපා, සිංහල මිනිස්සු හරි නපුරුයි ඔයාලට වෙඩි තියයි කියලා. ඒත් තමිලගේ තාත්තා හිනා වෙලා කිව්වලු ඒ බොරු කතා, එයාලා සිංහල අයව හරියට අඳුනන්නෙ නෑ. සිංහල මිනිස්සු හරි හොඳයි කියලා.

මම තමිලගෙ අයියගෙ කතාව එදා ගෙදර ගිහින් තාත්තාට කීවා.

"මම කියලා තියෙනවා නේද යන්න එපා කියලා ඒ පැත්තෙ, ආ?" මගේ කතාවෙන් කොටසක් යන්තමින් ඇහිලාදෝ අම්මා කේන්තියෙන් සාලෙට ආවා.



"ඉතින් අම්මා, තමිලා නෙමෙයිලුනෙ චුටි මාමාට බෝම්බ තිබ්බෙ. මම තමිගෙන් ඇහුවා. එයා බෝම්බයක් දැකලාවත් නැලු. ඒගොල්ලො හරි හොඳයි අම්මෙ. අම්ම කතා කරල බලන්නකො." මම කීවා.

"කතා කරන්න? මගේ වේදනාව දන්නෙ මම විතරයි. කාටවත් කරදරයක් නැති ඒ අහිංසකයාව නැති කළා. මගෙ දෑහැට පේන්න බෑ ඒ ඔක්කොම."

අම්මා කේන්තියෙන් කීවා.

"එහෙනම් අම්මෙ, වෙලේ ගෙදර සීයගෙ එළවලු කොරටුවට දෙණියෙ හරක් පැන්නාම, සීය අපේ හරක් එක්කත් තරහ වෙන්න එපායැ. ඒ වුණාට ඊයෙ ඔය හොඳට දක්කගෙන ගියේ, හියට." මම අම්මට එවෙලෙ මතක් වුණු උදාහරණයක් අරගෙන කියන්න හැදුවා. ඒත් අම්මට ඒකෙන් තවත් තරහා ගියා.

"මට නැති වුණේ එළවළු කොටුවක් නෙමෙයිනෙ. මගේ එකම මල්ලි.--හ්--හ්--" අම්මා ඇස් දෙක තදකරගෙන කුස්සියට ගියා.

අනේ පව්, මම ඕනෙ නැති කතාවක් කියලා අම්මගේ හිත ආයෙත් රිද්දුවා. ආයෙත් කවදාවත් අම්මට ඒ ගැන මතක් කරන්නෙ නෑ කියලා මම හිතා ගත්තා. ඒත් අම්මා ඒ ටික කිව්වෙ මට නෙමෙයි තාත්තට කියලයි මට දැනුණෙ. තාත්තා මාව අතින් අල්ලාගෙන උකුළේ වාඩි කරගත්තා.



"එහෙම තමයි පුතේ.
ගොඩක් ලොකු පාඩුවක්,
වේදනාවක් වුණාම දරාගන්න අමාරුයි.
ඒ අමාරුවෙ තරම දැනෙන්නෙ එයාලටම විතරයි.
එතකොට හරි වැරැද්ද, හොඳ නරක පෙනෙන්නෙ නෑ.
එතකොට ඒ ගොඩේ ඉන්න අහිංසක අයවත් පෙනෙන්නෙ වැරදියට.....
අම්මට නැති වුණේ අම්ම ගොඩක් ආදරේ කළ එකම මල්ලිනෙ. ඉතින් එතකොට අනික් අයට වඩා වැඩියෙන් දුක දැනෙනවා. තමිලිනීලගෙ අම්මටත් ඒ වගේ ලොකු තරහක් කේන්තියක් ඇති. එයාට නැති වුණෙත් එකම පුතානෙ.....

....වැඩිපුර පාඩුවක් වේදනාවක් ඇති වුණු කෙනාට තමයි වැඩිපුර තරහක්, වෛරයක් ඇති වෙන්නෙ. අපට එහෙම තරහක් නැත්තෙ අපට ඒ තරම්ම ලොකු වේදනාවක් දැනිලා නැති නිසා. අපටත් එහෙම දෙයක් වුණා නම් අම්මට වගේම කේන්තියක් අපටත් දැනේවි....ඒත් ඉතින් යුද්ධ කරනකොට ඔහොම තමයි. කාට කාටත් පාඩු හානි වෙනවා. පැත්තක ඉන්න අහිංසකයනුත් ඒකට අහුවෙනවා. ඒකට වෙන කාටවත් වෛර කරලා වැඩක් නෑ. ඒකනෙ යුද්ධ නොකර, පුළුවන් හැටියකට ප්‍රශ්න විසඳගන්න ඕනෙ කියන්නෙ."
තාත්තා මගේ ඔළුව අතගාමින් දිග විස්තරයක් කීවා.

තාත්තා හිතන විධියට, තාත්තගෙ අදහස්වලට, මට පුංචි ආඩම්බරයක් දැනුණා. ඒත් අම්මා පව්. අම්මගේ හිතේ තියෙන දුක මූණෙන් පෙනෙනවා. ආයෙත් මම අම්මට මේ ගැන මතක් කරන්නෙවත් නෑ කියලා මම හිතා ගත්තා. තමිලිනීලගෙ අම්මටත් මේ වගේ දුකක් ඇති. ඇත්තටම මේ අම්මලා දෙන්නා කවදාහරි යාළු කරන්න ඇත්නම්! ඒත් ඒක නම් කවදාවත් කරන්න බැරි වේවි. තාත්තා කියනවා වගේ, අපි ලේසියෙන් කිව්වට දුක පාඩුව වුණු කෙනාටලුනෙ ඒකෙ අමාරුව දැනෙන්නෙ. එතකොට යාළුවෙන්න බෑමයි කියලා හිතෙනවා ඇති.

එදාට පස්සෙ මම ආයෙත් තමිලිනීලා එක්ක සෙල්ලමට යන්නෙ නෑ කියලා ආයෙමත් හිතාගත්තා. අම්මගෙ හිත රිද්දන්න බැහැනෙ. ඒත් හවස් වෙනකොට හරි කම්මැළියි. සෙල්ලම් කරන්නමයි හිතෙන්නෙ. ඉතින් මාව කාන්දමක් වගේ ගල්පොත්තට ඇදෙනවා. ඊට පස්සෙ ඉතින් කළුවර වැටෙනකල් සෙල්ලම තමයි.

අපි එක එක දවසට කළේ එක එක සෙල්ලම්. බට්ට පනිනවා, අල්ලන සෙල්ලම් කරනවා ගල් දෙබොක්කාවෙ මාළු අල්ලනවා, ආයෙත් වතුරට දානවා, හැංගිමුත්තන් කරනවා. තමිලිනි එක්ක හැංගි මුත්තන් කරන එක නම් ලේසිම ලේසියි. ඇයි, පන්සලේ ඇතා හැංගුණා වගේ සිළිං-බිළිං ගාලා සද්දෙ ඇහෙනවනෙ. ඇස් පියාගෙන වුණත් ඉන්න තැන හොයා ගන්න පුළුවන්. තමිලිනීට ඒකට හරි කේන්තියි. මාව හොයන්න එයාට පැය ගණනක් යනවා. මම එයාව එක විනාඩියට හොයනවා.

සමහර දාට අපි ගෙදරින් එක එක කෑම අරගෙන එනවා, හවසට සෙල්ලම් කරලා කන්න. ලඩ්ඩු, බූන්දි, තෝසෙ, වඩේ, රොටී, පරෝටා, සමෝසා. ම්---ඇත්තම කිව්වොත්, වැඩිපුරම කෑම ගෙනෙන්නෙ තමිලිනී. මම ඉතින් ඉඳහිට දවසක තමයි වැලිතලප කෑල්ලක් එහෙම ගෙනියන්නෙ. අපේ ගෙදර ඒ තරම් රසකැවිලි හදන්නෙ නැනෙ. තාත්තට සීනි හොඳ නැලු.

සෙල්ලම් කරනකොට දවස ගෙවෙනවා දැනෙන්නෙවත් නෑ. දවසට පැය විසි හතරක් නැතුව තිස් හතරක් විතර තිබුණා නම් කොච්චර හොඳද? අපෝ නෑ. එතකොට චක්කර පාඩමත් පැය දෙකක් විතර දික් වෙයි.
තමිලිනී සමහර දාට ගල්පොත්තෙ "කෝලම්" අඳිනවා.
"කෝලං කෝලං හරි කෝලං"
මම විහිළු කරනවා.
තමිලිනීගෙ මූණ ඇඹුල් වෙනවා.
සමහර දාට කොහිල කපන්න වලට ආවාම,
අත්තම්මා ගල්පොත්තෙ නැවතිලා
අපි සෙල්ලම් කරන හැටි බලා ඉන්නවා.
සමහර දාට මම තමිලිනීට විහිළු කරනකොට
තමිලිනීගෙ මූණ දුකෙන් බර වෙනවා.
"එහෙම හිනා වෙන්න එපා පුතේ."
අත්තම්මා මට ආදරෙන් කියනවා.
තමිලිනීලා වඳුරු පිළිමයකට වඳින එකට
මම දවසක් හොඳටම විහිළු කළා.
තම්ට ඒ ගැන ගොඩක් දුක හිතුණා.
තව චුට්ටෙන් අඬනවා.



"අනේ චන්දු, ඒ අපේ හනුමන් ෂාමි. අපේ දෙයියො ෂාමිලා තමයි අපිට පිහිට වෙනවා. ඒවාට ඉනා වෙන්න යෙපා චන්දු." තමිලිනී මූණ ඇඹුල් කරගෙන කීවා. මට ඒත් තවත් මොනවා හරි කියලා තමී කේන්ති ගස්සන්න හිතුණා.

"පුතේ, එහෙම අනික් අයගෙ සිරිත් විරිත්වලට හිනා වෙන්න එපා. අපට ඒවා අමුතු වුණාට එයාලට ඒවා වටිනවානෙ. අපට ඒවා අමුතුවට පෙනෙන්නෙ අපට ඒවා පුරුදු නැති නිසයි. ඒ වගේම අපේ දේවලුත් එයාලට අමුතු ඇති. අපේ ඒවාට එයාලා හිනා වුණොත් අපි කැමති නෑ නේ? ඒ වගේ තමයි එයාලත්. අපට අපේ සිරිත් විරිත් වටිනවා වගේම එයාලට එයාලගෙ සිරිත් විරිත් වටිනවා. හොඳ ළමයි එහෙම හිනා වෙන්නෙ නෑ. ඒවාට ගරු කරනවා."
එදා හවස අත්තම්මා මාව ළඟට අරගෙන කියා දුන්නා.

එදා හැන්දෑවෙ ඇඟ සෝදගෙන
අත්තම්මයි මමයි පන්සල් යන්න
ලැහැස්ති වුණා. තමී වැට අයිනට
ඇවිත් හෙන්දිරික්කා ගස් අතරින්
මට අත වැනුවා. මම ළඟට
ආවාම මට මොකක්දෝ දුන්නා.
කහ පාට දාස් පෙතියා මල් වට්ටියක් !



"අද ඔයාලා පන්ෂල් යෙනව කීවනේ ?
ඉතින් බුදු ෂාදුට පුජ කරන්ඩ."
තමී මල් වට්ටිය මගේ
අතේ තියලා හැරිලා ගියා.
මට දැනුණෙ ලොකු ලැජ්ජාවක්.
මම එයාට කොයි තරම් නම් විහිළු
කරලා තියෙනවද, එයාලගෙ සිරිත් විරිත්වලට.
නහයෙ කරාබුවට, කකුලෙ ගෙජ්ජිවලටත් විහිළු කරලා තියෙනවා.
ඒත් එයා කවදාවත් මට විහිළු කරලා නෑ. අද ඒ තරම් විහිළු කරලත්,
තරහා වෙනවා වෙනුවට මට මල් වට්ටියකුත් ගෙනැත් දුන්නා පන්සල් යන්න.

එදා මම පන්සල් ගිහින් එනකල්ම හිතුවෙ මං ගැන. මගේ අතින් කොයි තරම් නරක වැඩ වෙනවද කියලා. ඇයි මට තමී වගේ හොඳ වෙන්න බැරි? පහුවදා උදේ මම මුළු වත්තෙම තියෙන මල් ටික ඔක්කොම කැඩුවා. බෝලිද්ද, කටරොළු, අරලිය, දාස් පෙතියා, කොබෝලිල, බෝගන්විලාත් කැඩුවා. ගස්වල උඩ නැගලා, අතුවල එල්ලිලාත් කැඩුවා. හිතේ අමාරුව යන්නත් එක්ක සිලි සිලි මලු පහක්ම පුරවලා තමිලිනීට අඬගැහුවා.

"හි - හි - හි - මේ මොකඩ මේ?"
තමී මගේ දිහා බැලුවෙ තවත් විහිළුවක්ද කියලා වගේ.

"ඔයාට ! දෙවියන්ට පූජ කරන්න. මල් වැල් හදලා කොණ්ඩෙ දාගන්න. ඕනෙ එකක් කරන්න." මම කීවා. තමිලිනී පුදුමයෙන් වගේ මගේ දිහා බැලුවා.
"අහ්--බෝම ඉෂ්තුති." තමිලිනී මල් ටික උස්සාගෙන ගෙදර දිව්වා.
එදා හවස සෙල්ලම් කරන්න එනකොට
තමිලිනිගෙ ඔළුව වැහෙන්න තරම් මල්.



"පූජ කරල ඉත්තුරු ටික මං කොණ්ඩෙට දැම්මා.
ලෂ්ෂනයිඩ." තමිලිනී ඔළුව හරවමින් ඇහුවා.
"ලෂ්ෂනයි, ලෂ්ෂනයි, බෝම ලෂ්ෂනයි."
මම හිනාව නවත්වගත්තෙ ගොඩක් අමාරුවෙන්.
කොච්චර හිතුවත් විහිළුවක් කරන්න හිතෙනවානෙ.

අපිත් එක්ක "පන්ෂල්" යන්න තමිලිනී හරි ආසයිලු.
ඒත් බයයිලු අම්ම බනී කියලා.
තමිලිනී පන්සලට ගියොත් හැමෝම බලයි මේ
කවුද කියලා. නළලෙ මොට්ටු තියලා,
කොණ්ඩෙ මල් ගහලා, කකුලෙ ගෙජ්ජි දාලා.
සමහර විට නැටුමකට ඇඳපු ළමයෙක් කියලා හිතයි.
පුංචි ගෑනු ළමයි නම් එයාට ගොඩක් ආස වෙයි.
ඒත් මොට්ටුව මකලා ළමා සාරියක් ඇන්දෙව්වොත් නම්
තමිලිනී සුදු පුංචිලාගෙ බට්ටි නංගි වගේමයි.
කිසි වෙනසක් නෑ. දෙමළද සිංහලද කියලා
හොයන්නවත් බෑ. දහම් පාසල් එක්ක යන්න වුණත් පුළුවන්.

මම දැන් ඉස්සරට වඩා ගොඩක් හොඳ වෙලා කියලා දවසක් අත්තම්මා කිව්වා. සමහර විට තමිලිනී නිසාද දන්නෙ නෑ. හොඳ ළමයි එක්ක ඉන්නකොට අනික් අයත් හොඳ වෙනවා කියන්නෙ ඇත්ත වෙන්න ඇති.

කිව්වත් වගේ, ඇත්ත තමයි. දැන් මට ඉස්සර වගේ කේන්ති යන්නෙත් නෑ. දවසම ඉන්නෙ සතුටින්. අයියා එක්ක ඉන්නකොට දවසට තුන් හතර පාරක්වත් ගුටි කනවා. මං පොඩි නිසා, අයියට ගහන්න බැරි නිසා, ඉතුරු දවසම ඉන්නෙ තරහින්. ඒ මදිවට රණ්ඩු බේරන්න ඇවිත් අම්මා අපි දෙන්නටම බනිනවා. ඒත් දැන් එහෙම නෑ. මට කේන්ති ගිය දවසක් මතක නෑ. තමිලිනී හරි හොඳයිනෙ. ඉතින් කේන්ති යන්න හේතුවක් වෙන්නෙ නෑ.

.....තරහ වුණත් ඉතින් බොරුවට තමයි. වැඩිවෙලා තරහ වෙලා ඉන්න බෑ. තරහ වුණු කෙනා යාළු වෙන්න ඕනෙ. ඒත් වැඩිපුරම තරහවෙන්නෙ මම. වැඩිපුරම යාළුවෙන්නෙ තම්ලිනී. එතකොට නම් මට ගොඩක් දුක හිතෙනවා. මම ගොඩක් නපුරුද කියලත් මට හිතෙනවා. කොහොම හරි තම්ලිනී නිසා මම ගොඩක් හොඳ වෙලා කියලා නම් මටත් ටික ටික දැනෙනවා. අපේ අයිය නිවාඩුවට ආවම අයියාවත් තම්ලිනී එක්ක යාළු කරවන්න ඕනෙ. එයා හොඳ වුණොත් කාටද හොඳ? මටනෙ !

අපේ අයිය වගේ නෙමෙයි, තමීලගෙ අක්කා හරි හොඳයිලු. එයාට ගොඩක් ආදරෙයිලු. රසට කෑම හදන්නත් පුළුවන්ලු. බැරිද දන්නෙ නෑ අපේ අයියව දීලා, තමීලගෙ අක්කව අපට මාරු කරගන්න. තමීලගෙ අක්ක විතරක් නෙමෙයි, මැරුණු අයියත් හරි හොඳයිලු. තමීට ගොඩක් ආදරෙයිලු. තමී ඒ ගැන වැඩිපුර කතා කරන්නෙ නෑ. ගොඩක් දුක ඇති. පව් ! අපේ අම්මට චූටි මාමා ගැන වගේ තමීලටත් අයියා ගැන දුක ඇති. යුද්ධ කරනකොට ඔහොම තමයි කියලයි තාත්තා කියන්නෙ.

මොනවා වුණත් අපි දෙන්නට නම් ඒවා වැඩක් නෑ. හවසට හති වැටෙනකල් සෙල්ලම් කරන්න තියෙනවා නම් වෙන මොනවත් ඕනෙ නෑ. සමහර දාට ඇස් රතු වෙනකල් අපි සපුමල් ඔයේ නානවා. ඉවුරෙ ඉඳල ගල් දෙබොක්කට “ජබුස්” ගාලා පනිනවා. ඊට පස්සෙ අපි ඔයේ උඩහ ඉඳලා පහළට පීනනවා. මට නම් කොච්චර කළත් තමී තරම් හොඳට පීනන්න බෑ. තමී නම් කුණිස්සෙක් වගේ පීනලා යනවා. දිය යට කිමිදෙන්නත් පුළුවන්. මට වෙලාවකට තමී ගැන පුංචි “ඉරිසියාවකුත්” හිතෙනවා. ඒත් යාළුවන්ට ඊර්ෂ්‍යා කරන්න හොඳ නැහැනෙ.





"තමීට හොඳට පීනන්න පුළුවන්" කියලා
අත්තම්මාට කිව්වාම
අත්තම්මා ඉස්සරවෙලාම ඇහුවෙ,
"පුතා ඒ බව එයාට කිව්වද?" කියලයි.
"එයාට මොකටද කියන්නෙ!" මම කීවා.
"පුතේ එහෙම හොඳ දෙයක් දැක්කාම
ඒ බව ඒ කෙනාට කියන්න ඕනෙ.
ඒක හොඳ ලස්සන පුරුද්දක්." අත්තම්මා කීවා.
හොඳ දෙයක් දැක්කාම ප්‍රශංසා කරන්න
පුරුදු වෙන්න කියලා ඉස්කෝලෙ ගුරුතුමීත්
කියනවා තමයි. ඒත් මට තවමත් තමීට
කියා ගන්න බැරිවුණානෙ, "ඔයා හරි හොඳයි,
ඔයාට හොඳට පීනන්න පුළුවන්" කියලා.
හිතෙන් කීවාට කටින් කියාගන්න බැරි වුණේ
චුට්ටක් විතර "ඉරිසියාව" නිසා වෙන්න ඇති.

ඒත් පීනන්න පුළුවන් වුණාට මං වගේ ගස් නගින්න නම් තමිලිනීට බෑ. මම විනාඩි දෙකට පොල් ගහ මුදුනට නගින්නෙ තමීලගෙ "හනුමන් සාමි" වගේ. "අහ් වැරදුණා!" ආගම ජාතිය විහිළුවලට ගන්න හොඳ නැනෙ. කොහොම හරි තමී නම්, "ඔයාට ඔන්දට ගෂ් නගින්න පුළුවන් නේ" කියලා කීප දවසක්ම කීවා. ඒත් ඒ එක දවසකවත් මට කියන්න බැරි වුණානෙ "ඔයාට හොඳට පීනන්න පුළුවන්" කියලා. ඉක්මනටම දවසක කියන්න ඕනෙ.

ඒ වුණාට දැන් නම් කාටවත් පීනන්න පුළුවන් වුණාට වැඩක් නෑ. ඔයේ නාන්න තහනම්. ඔයේ උඩහ ජලාශය හදනවානෙ. ඉතින් වාන් දොරටු සැරින් සැරේ අරිනකොට ඔයේ වතුර හිටි හැටියෙ සැර වෙනවා. ඒ නිසා දැන් ඔයේ නාන්න ගමේ හැමෝටම තහනම් කරලා තියෙන්නෙ. ඒ නිසා අපිට දැන් ඉස්සර වගේ ඔයට පනින්න බෑ. ඔයේ දියබුං ගහන්නත් බෑ. ගල් දෙබොක්කාවෙ මාළු අල්ලන්නත් බෑ.

සමහර දාට අපි ඔය ඉවුර දිගේ ඔහේ ඇවිදිනවා. බෝවිටියා, කාමරංකා, ගඳපාන, මසං, හිඹුටු, බකිණි, ඇඹුල් ඇඹිලිය, ගොරකා මද කකා, කුරුලු කූඩු බල බලා, හැන්දෑ වෙනකල් යනවා. සමහර දාට ඇස් ඇරලාවත් නැති කුරුලු පැටව් ඉන්න කූඩු හම්බ වෙනවා. තමිලිනී කුරුලු පැටවුන්ට හරි ආසයි.

එක දවසක් අපි වෙනදා වගේ ඔය ඉවුර දිගේ ඇවිදිමින් හිටියා. එක එක ගෙඩි කාලා බඩත් පිරිලා. අපි ගල් පොත්ත උඩ ඩාඩි වෙලා ගල් දෙබොක්කාවට කකුල් ඔබාගෙන කොරළි ගණන් කළා.



හුඟ දවසකින් ඔයට පනින්නත් බැරි වුණා.
ඔයේ වතුර නම් ටිකක් වැඩියි වගේ.
උඩහ වාන් ඇරලාද දන්නෙ නෑ.
“තමී, අපි අද දියබුං ගහමුද?” මං ඇහුවා.
“අයියයියෝ, නේ නේ, යේක වතුර ගොඩා---යි”
තමිලිනී අත් දෙක ගසමින් කෑ ගැසුවා.
“අයියෝ, ඔච්චර බය මොකද්ද. මට නම් මේ ඔය ගෙදර වගේ.
හරි එහෙනම් අපි ගල් දෙබොක්කාවටබැහැලාකොරළි පැටව්අල්ලමුද?”මම කීවා.
“බේ බේ, වතුර වෙඩි වෙයි.” තමිලිනී ඔළුව වනමින් කීවා.
“එහෙනම් ඔයා ඉන්න. මම කොරළි අල්ලනවා.”
මම ගල් දෙබොක්කවට බැහැලා කොරළිපැටව් අල්ලන්න පටන් ගත්තා. ටිකක් වෙලා යනකොට තමිලිනීත් වතුරට බැස්සා. අපි දෙන්නාම කොරළි පැටව් අල්ලමින්, ආපහු වතුරට දමමින් සෙල්ලම් කළා. කොරළි පැටවුනුත් අපිව පුරුදු නිසාදෝ අපි වටේම පීනමින් හිටියා.
“වහ් ! බත් ඇට ටිකක් දැම්මා නම් සිරි සිරි ගාලා මාළු පිරෙනවා.”

ඊළඟට අපි ගල් දෙබොක්කාව පීරමින් මාළුවන් ගණන් කළා. මම මඩකරියනුත් තමිලිනී දණ්ඩි පැටවුනුත් ගණන් කළා. අපි මාළු ගණින අතරේ ඔයේ වතුර මට්ටම ටිකෙන් ටික වැඩි වෙන බව අපි දෙන්නාටම දැනුණෙ නෑ. ඒ තරමට අපි මඩකරියනුත් දණ්ඩි පැටවුනුත් සොයන්න උනන්දුවෙනුයි හිටියෙ. අපි තව තවත් මාළුවන් ගණන් කළා. වතුර ටිකෙන් ටික බොර පාට වේගෙන ආවත් මට ඒ ගැන අමුත්තක් දැනුණෙ නෑ. මගේ හිත තිබුණෙ වැඩිපුර මඩකරියන් හොයා ගන්නයි.
“වන්දු වතුර මඩ නේ?” ටික වෙලාවකින් තමී කීවා.




ඒ එක්කම පිටිපස්සෙන් ආ තරමක අමුතු “හෝ හෝ” හඬකට අපි දෙන්නාම හැරිලා බැලුවා. එතකොටම අපි දැක්කේ එක පාරටම ගල් දෙබොක්කාව වසාගනිමින් එන මහා වතුර කඳකුයි. ඒත් ඒ වෙනකොට හිතන්න දෙයක්වත් කරන්න දෙයක් ඉතිරි වෙලා තිබුණේ නෑ. කිසිම දෙයක් හිතා ගන්න වෙලාවක් තිබුණෙත් නෑ. මොනවා උනාද කියලාවත් හිතාගන්න බැරි වුණා. අපි දෙන්නාම පුළුවන් තරම් හයියෙන් කෑ ගැහුවා. කෑ ගැහුවා නෙමෙයි කෑ ගැහුණා. ඒත් වතුර පාරෙ සැරට කෑ ගහගන්නත් බැරි තරම්.



අපි වතුර පාරත් එක්ක ඔය දිගේ ඇදිලා ගියා. ඒ එක්කම තම්ලිනී වතුර පාරට ඔය මායිමට තල්ලු වුණා. ළඟ තිබුණු කුඹුක් මුලක තමී යන්තමින් එල්ලුණා. මහා වතුර කඳ ඔය දිගේ ඇදිලා ගිහින් ඔයේ වංගුවේ සුලි ගැහුණා. මාව දිය සුළියේ කැරකෙන හැටි මට හොඳින් දැනුණා. මම දිය සුලියෙන් ගැලවෙන්න මහන්සි ගත්තා. ඒත් ඒ එක්කම මගේ ඔලුව කොහෙදෝ හයියෙන් වැදෙනවා මට දැනුණා. ඔළුව හිරි වැටිලා වටේම කළුවර වෙන්න පටන් ගත්තා.

ඒ එක්කම තමී කුඹුක් මුල අත ඇරලා මගේ දිහාට එනවාත් මගේ කමිසයෙන් අල්ලාගන්නා හැටිත් මට යාන්තමින් පෙනුණා. අන්තිමට මගේ කණ ළඟින්ම වගේ ඇහුණු තමීගේ කෑගැසුම් හඬත් එක්කම හැම දේම කළුවර වෙලා මැකිලා ගියා. මට මතක තිබුණෙ එච්චරයි.....

....ඊට පස්සෙ මට පෙනුණෙ පුංචි පුංචි තරු එළි. ඊළඟට සුදු පාට බිත්තියක්. අපේ ගෙදර බිත්තිය නම් වෙන්න බෑ. ඒත් හරි හැටි පැහැදිළි නෑ. “මේ කොහෙද, මොකද වුණේ?” මම ඇස් ඇරලා බැලුවා.



“සිහිය ඇවිල්ලා, සිහිය ඇවිල්ලා,” කවුදෝ කෑ ගහනවා මට ඇහුණා.
එක එක්කෙනා එහෙ මෙහෙ යනවාත් මගේ මූණට එබෙනවාත් මට දැනුණා.
ඒත් කවුරුවත් මට පැහැදිලිව අඳුන ගන්න බැරි වුණා.
ඒ අතරේ අම්මාගේ මුහුණ මට හොඳින් පෙනුණා.
“මගේ පුතේ! මගේ චූටි පුතේ!” අම්මා අඬමින් මාව බදාගත්තා.
“ඇයි මේ?” මට හිතා ගන්න බැරි වුණා.
ඒ එක්කම මම දැක්කෙ පුදුම දෙයක්. මගේ ඇඳ ළඟම හිටියේ තමීගේ අම්මා, අපේ අම්මාගේ ඔළුව අතගාමින්.
“මේක නම් වෙන්න පුළුවන්ද? මම දකින්නෙ හීනයක්ද?”
මම ඇසි පිය ගහලා ආයෙත් බැලුවා. ඒ එක්කම තමී මගේ ළඟට ආවා. තමීගේ නළලට සුදු පාට පැලැස්තර දමලා.
“චන්දු ඔයාට රිදෙනවද? අපි ඔයේ ගාගෙන ගියා මතකයිද? ඔයාගෙ ඔළුව ගලේ වැදිලා ෂිහිය නැති වෙලා දැන් දවෂ් දෙකක් තමයි වෙනවා.”
තමී මගේ මූණට එබිලා කීවා.



------ මට හැමදේම හීනයක් වගේ මතක් වුණා. මම නැගිටින්න හැදුවා.
"නැගිටින්න එපා මල්ලි ඔහොම ඉන්න."
අයියා මගේ අත අතගාමින් කිව්වා. මගේ ඇස් දෙකෙන් කඳුළු ආවා.
අයියා, අම්මා, තාත්තා, අත්තම්මා, තම්, තම්ලගෙ අම්මා, තාත්තා, හැමෝම මගේ ඇඳ වටේ. මේක හීනයක්ද? මම ඇසි පිය ගහලා ආයෙත් බැලුවා. නෑ, හැමෝම ඇත්තටම යාළුවෙලා වගේ. හැමෝම එකතුවෙලා ආදරෙන් ඉන්නකොට කොයි තරම් සතුටක් හිතට දැනෙනවද? ඇඳෙන් නැගිටලා හොඳට ඇස් ඇරලාම බලන්න ඕනෙ කියලා මට හිතුණා.
මම අමාරුවෙන් නැගිටින්න හැදුවා. ඒ එක්කම ඔළුව පිටිපස්සෙන් ලොකු කැක්කුමක් ආවා. "ආහ් ---ඌහ්---" මට කෑ ගැහුණා. එතකොටම තම්ගෙ අම්මයි අපේ අම්මයි මාව දෙපැත්තෙන් අල්ලා ගත්තා.
"එපා ! එපා !" "වේන්ඩාම් ! වේන්ඩාම් !"
අම්මලා දෙන්නා කෑ ගැහුවා. අම්මලා දෙන්නාගේ මුහුණු දකින කොට ඇඟට දැනුණු අමාරුව පහු කරගෙන ලොකු සතුටක් මගේ හිතට දැනුණා. ඔළුව කොයි තරම් රිදුණත් කමක් නෑ, මට හැමෝටම ඇහෙන්න හයියෙන් කෑ ගහලා හිනා වෙන්න හිතුණා...... සතුටට !